**ශීර්ෂය 117 - වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**විගණන විෂය පථය**

---

වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 17 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත්වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.133,280,026,262 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.131,098,836,537 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.2,181,189,725 ක් හෙවත් සියයට 1.64 ක් ඉතිරිවී තිබුණි.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 264,327,300 | 263,302,231 | 1,025,069 | 0.39 |
| මූලධන | 133,015,698,962 | 130,835,534,306 | 2,180,164,656 | 1.64 |
| **එකතුව** | **133,280,026,262** | **131,098,836,537** | **2,181,189,725** | **1.64** |

**(ආ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.346,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11701 | 8,000,000 | 7,665,597 | 3,900,000 | 5,512,563 | 34,000,000 | 26,714,582 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 11701 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,565,173 ක්වූ අතර, එම හිඟහිටි ශේෂවලින් රු.1,084,190 ක් අයකර ගැනීමේ කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) අමාත්‍යාංශයෙන් පිටතට මාරුවී ගිය නිලධාරීන් 14 ට අදාලව එකතුව රු.1,034,930 ක ණය ශේෂය තුළ නිලධාරීන් 12 කට අදාල රු.745,099 ක ණය ශේෂය අයකර ගැනිමට නොහැකිව පැවතුණි.

(iii) මියගිය හෝ විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් වර්ෂය අවසානයට අයවිය යුතු රු.215,633 ක ණය ශේෂයන් අතුරින් රු.24,481 ක ණය ශේෂයක් අයකරගත නොහැකිව පැවතුණි.

(iv) සේවය අතහැර ගිය නිලධාරියෙකුට අදාලව වර්ෂ 16 ක සිට පැවත එන රු.21,140 ක ණය ශේෂය හා වැඩ තහනම් කළ නිලධාරියෙකුට අදාලව වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එන රු.293,470 ක ණය ශේෂයද අයකර ගැනිමට නොහැකිව පැවතුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන 09 ක් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණි.

## 1.5 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක PE/423 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | මාර්ග නඩත්තු භාර අරමුදලෙහි ඉදිරි වර්ෂයට (2013) අදාල වාර්ෂික අයවැය රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2012 සැප්තැම්බර් 15 දින හෝ ඊටපෙර ඉදිරිපත් කළ යුතු වුවත්, මාර්ග නඩත්තු භාර අරමුදල විසින් 2013 වාර්ෂික අයවැය රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැති අංක පීඑෆ් 402 හා 402(1) චක්‍රලේඛ | වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශය විසින් පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2013 වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව 2014 නොවැම්බර් 04 දින සභාගත කර තිබුණි. |

## 1.6 කාර්යසාධනය

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථාවන් පහත දැක්වේ.

**(i)** **මාර්ග නඩත්තු භාර අරමුදල**

බස්නාහිර පළාතේ A හා B මාර්ග නඩත්තු කටයුතු සඳහා මාර්ග නඩත්තු භාර අරමුදලින් වෙන් කර තිබුණු රු.828,829,239 ක මුදලින් රු.19,574,706 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග නඩත්තු සඳහා වැය කර තිබුණි.

**(ii)** **ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - අදියර I**

මෙම ව්‍යාපෘතියට බඳවා ගන්නා ලද පරිගණක ක්‍රියාකරුවෙකු හා රියදුරෙකු වෙනුවෙන් 2013 වර්ෂයේදී ව්‍යාපෘති අරමුදලින් එකතුව රු.1,476,335 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබූ නමුත්, ව්‍යාපෘතියේ සේවය සඳහා බඳවා ගෙන තිබුණු එම කාර්ය මණ්ඩලය ව්‍යාපෘති කාර්යයන්වල නොයොදවා අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු කිරිම සඳහා යොදවා තිබුණි.

**(ආ)** **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අවස්ථාවන් පහත දැක්වේ.

**(i)** **බේස්ලයින් මාර්ග ව්‍යාපෘතිය - අදියර III**

හයිලෙවල් මාර්ගය කිරුළපන සිට කොළඹ-හොරණ මාර්ගය දක්වා දීර්ඝ කිරීමේ කටයුතු 2009 නොවැම්බර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමත කර තිබුණද 2013 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා වූ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවලින් සියයට 7 ක ප්‍රමාණයක් පමණක් නිම කර තිබුණි.

**(ii)** **බදුල්ල-මහනුවර විකල්ප මාර්ගය (රජ මාවත)**

කි.මී.4.2 ක් වූ මෙම මාර්ගය ඉදිකිරීම් 2013 වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන්ම නිමකිරීමට ඉලක්ක කර තිබුණද, පාරිසරික අධ්‍යයන වාර්තාව (EIA) ලැබීම ප්‍රමාදවීම නිසා ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකිව පැවතුණි.

**(iii)** **මාර්ග නඩත්තු භාර අරමුදල**

මාර්ග ආංශික සහයෝගීතා ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන භාරකාර අරමුදල් ලේකම් කාර්යාලයට තාක්ෂණික සහයෝගය ලබාගැනීම සඳහා රු.81,550,939 ක් වැයකර උපදේශක සේවා ලබාගෙන තිබුණි. එමඟින් නිර්දේශ

කර තිබූ මූලා‍ ප්‍රතිපත්ති මෙහෙයුම් අත් පොතෙහි සඳහන් 22 RMTF ප්‍රතිපත්ති අංක XIX, XX, හා XXI ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර නොතිබුණි. 2011 අගෝස්තු 09 දිනැති අංක DMS/E3/5/108/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියෙන් මෙම අරමුදල සඳහා ලේකම්, ප්‍රධාන ඉංජිනේරු, ගණකාධිකාරි, තාක්ෂණික විගණක සහ කළමනාකරණ සහකාර යන ස්ථිර තනතුරු අනුමත කර තිබුණි. එම තනතුරු සඳහා ස්ථිර සේවකයින් බඳවා නොගෙන වැඩ බැලීමේ පදනම මත අමාත්‍යාංශයේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සේවයේ යොදවා තිබුණු බව නිරීක්ෂණය විය.

**(iv) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - අදියර II**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- උස්වැටකෙයියාව-පමුණුගම මාර්ගය සංවර්ධනය කිරීමේදී ඉතිරිවූ රු.මිලියන 240 ක් උපයෝගී කර ගෙන මීගමුව-ගිරිඋල්ල මාර්ගය සංවර්ධනය කිරීමට ව්‍යාපෘතිය තීරණය කර තිබුණි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර මීගමුව-ගිරිඋල්ල මාර්ගයේ සංවර්ධනය කිරීමේ මූලික ඇස්තමේන්තුව රු. මිලියන 277.91 ක් වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.මිලියන 391.91 ක් වැයකර තිබුණි.
- උස්වැටකෙයියාව-පමුණුගම මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතු නියමිත තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුව සිදුනොකිරීම හේතුවෙන් රු.12,694,590 ක් වැයකොට වැල්ලෙන් පැහැයීම (sand blasting) සිදුකර තිබුණි. කොන්ත්‍රාත්කරුවන්ගේ හානිපූර්ණය කිරීමේ කාලය තුළ මෙම කටයුතු සිදුකරගත යුතු වුවත් එසේ සිදුනොකිරීමේ හේතුවෙන් මෙම කාර්යයන් ව්‍යාපෘති අරමුදල් වැයකර ඉටු කර තිබුණි.

**(v) හැටන්-නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- හැටන්-නුවරඑළිය මාර්ගයේ කි.මී.93+550, 89+840 වම්පස හා කි.මී.91+540 වම්පස කොටසෙහි මාර්ගයෙන් ඉවත්කරන පස් අක්‍රමවත්ව තැබීම හේතුවෙන් ඊට ආසන්නයෙන් පවතින ඉහළ කොත්මලේ ජලාශය වෙත පස් සේදී ගොස් තිබුණි. මධ්‍යම පරිසර

අධිකාරිය විසින් හඳුන්වාදී තිබූ පරිසරය සුරැකීමේ යෝජනා කෙරෙහි කොන්ත්‍රාත්කරුවන්ගේ අවධානය යොමුනොකිරීම නිසා මෙවැනි තත්ත්වයක් හටගෙන තිබුණි.

- හැටන්-නුවරඑළිය මාර්ගය වෙනුවෙන් පිළියෙල කරන ලද විස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම නිසි ආකාරයෙන් පිළියෙල නොකිරීම හේතුවෙන් රු. මිලියන 3,140 අමතර වැඩ ප්‍රමාණ පත්‍රයක් පිළියෙල කර තිබුණි. මෙහි මූලික වැඩ ප්‍රමාණ පත්‍රය පෞද්ගලික ආයතනයක් විසින් පිළියෙල කර තිබුණද නිසි ආකාරයෙන් ප්‍රමාණ පත්‍රය පිළියෙල නොකිරීම පිළිබඳව ඔවුනට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඇ) සැලැසුම් කිරීම**

---------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

-----------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(i) මහකොළඹ ප්‍රදේශයේ රථවාහන ගමනාගමන කළමනාකරණය**

--------------------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට නිමකිරීමට ඉලක්ක කර තිබුණු කොල්ලුපිටිය-ශ්‍රී ජයවර්ධනපුර මාර්ගයේ වැලිකඩ මංසන්ධිය සහ HSBC බැංකුව පිහිටි මංසන්ධිය වැඩිදියුණුකිරීමේ හා මාර්ග සංඥා ස්ථාපිත කිරීමේ කටයුතු සහ කොල්ලුපිටිය-ශ්‍රී ජයවර්ධනපුර මාර්ගයේ වැලිකඩ-කොහිලවත්ත මාර්ග සම්බන්ධ කරනු ලබන මංසන්ධියේ ඉදිකිරීම් කටයුතු නියමිත දිනට සිදුකර නොතිබුණි.

(ii) **ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PRP-I)**

-----------------------------------------------------------------------------------

මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලබන මාර්ග අතුරින් පහත දැක්වෙන මාර්ගවල කටයුතු 2013 වර්ෂය අවසාන වන විට නිමකිරීමට ඉලක්ක කර තිබුණද එම ඉලක්ක සපුරාගෙන නොතිබුණි. එම මාර්ගවල භෞතික ප්‍රගතිය පහත පරිදි විය.

- පැලවත්ත-කන්කොටියාවත්ත-මොරවක මාර්ගය - සියයට 78
- තිරුවානකැටිය-අගලවත්ත මාර්ගය - සියයට 57

**(iii) ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PRP-II)**

මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලබන මාර්ග අතුරින්, 2013 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ඉලක්කයට ළඟා නොවූ මාර්ග සම්බන්ධ තොරතුරු පහත පරිදිය.

| **කාර්යය** | **ඉලක්ක ගත ප්‍රගතිය** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|
| | **සියයට** | **සියයට** |
| ගලගෙදර-රඹුක්කන මාර්ගය | 70 | 50 |
| තැන්නේකුඹුර-රිකිල්ලගස්කඩ රාගල මාර්ගය | 65 | 48 |
| තිරුවානකැටිය-අගලවත්ත මාර්ගයේ පාලම් නැවත ඉදිකිරීම/පුළුල් කිරීම | 100 | 64 |
| නාගොඩ-කලවැල්ලාව බැල්ලපිටිය මාර්ගය | 100 | 58 |

**(iv) උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය-අතිරේක ණය/අරමුදල් සැපයීම**

2013 වර්ෂය අවසන් වනවිට ප්‍රතිසංස්කරණය කිරීම/වැඩිදියුණු කිරීමට ඉලක්ක ගත ප්‍රගතියට වඩා අත්පත් කරගත් භෞතික ප්‍රගතිය පහත මට්ටමක පවතින මාර්ග කොටස් පිළිබඳ තොරතුරු පහත පරිදිය.

| **කාර්යය** | **ඉලක්ක ගත ප්‍රගතිය** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|
| | **සියයට** | **සියයට** |
| • වව්නියාව-හොරොව්පොතාන මාර්ගය (කි.මී.24+000 සිට 34+950 දක්වා) | 45 | 11 |
| • මැදවච්චිය-කැබිතිගොල්ලෑව මාර්ගය (කි.මී.0+000 සිට 12+600 දක්වා) | 40 | 5 |
| • මැදවච්චිය-කැබිතිගොල්ලෑව මාර්ගය (කි.මී.12+600 සිට 25+400 දක්වා) | 40 | 3 |
| • කැබිතිගොල්ලෑව-පදවිය මාර්ගය (කි.මී.10+000 සිට 15+500 දක්වා) | 36 | 2 |
| • කැබිතිගොල්ලෑව-පදවිය මාර්ගය (කි.මී.15+500 සිට 31+345 දක්වා) | 37 | 3 |

**(v) පාලම් 46 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

ප්‍රංශ රජයේ ආධාර මත ක්‍රියාත්මක කර තිබුණු මෙම ව්‍යාපෘතියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ඉදිකිරීම් කටයුතු සඳහා සියයට 40 ක ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු අතර එම ඉලක්කයන් වෙත ළඟා නොවූ පාලම් ඉදිකිරීම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| කාර්යය | භෞතික ප්‍රගතිය |
|---|---|
| | සියයට |
| • හංවැල්ල-පූගොඩ-ඌරාපොල මාර්ගයේ අංක 11/2 (B146) | 15 |
| • මාතලේ-ඉලුක්කුඹුර-පල්ලේගම මාර්ගයේ අංක 9/8 (B274) | 08 |
| • -එම- 2/8 (B274) | 05 |
| • පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි මාර්ගයේ අංක 182/6 (A005) | 29 |
| • කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ අංක 207/1 (A004) | 22 |
| • බඩල්කුඹුර-බුත්තල-සෙල්ලකතරගම මාර්ගයේ අංක 8/2 (B035) | 08 |

**(vi) ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ වූ මාර්ග කොටස්වල ඉදිකිරීම් කටයුතු නිමවී තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද මහාමාර්ග මහලේකම් කාර්යාලය ඉදිකිරීම 2010 අගෝස්තු මාසයේදී ආරම්භ කර තිබූ අතර 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 04 ක කාලයක් ගතවී තිබුණද අත්කරගෙන තිබුණු සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 75 ක් වි තිබුණි. 2014 දෙසැම්බර් 01 දින වන විටද ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.

**(vii) වරාය අංශය**

වරාය අංශය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර තිබුණු වයාපාති සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය. විස්තර පහත දැක්වේ.

- **ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල**
  **----------------------------------------------------------------------------------**

  2013 ජනවාරි මස ඉදිකිරීමට යෝජිතව තිබූ මෙම ගොඩනැගිල්ලෙහි කටයුතු මාස 30 ක කාලසීමාවක් නිමකිරීමට සැලසුම් කර තිබුණි. 2014 මාර්තු 31 දින වන විටත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

- **ශ්‍රී ලංකා නැව් සංස්ථාව**

  **-----------------------**

  ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ සැලසුම්ගත ව්‍යාපෘති අතරින් නැව් 04 ක් මිලදී ගැනීමේ පළමු අදියර යටතේ සැලැසුම් කර තිබුණද, එය ඉටුකරගෙන නොතිබුණි.

## 1.7 අවිධිමත් ගනුදෙනු

**--------------------**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**
**-----------------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 03 වන මාර්ගෝපදේශය අනුව විශේෂිත භාණ්ඩ (Specific goods) මිලදී ගැනීම සඳහා සුදුසුම ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ යුතු වුවත්, එම විධිවිධාන කෙරෙහි අවධානය යොමු නොකර එකතුව රු.822.700 වටිනා පරිගණක, ප්‍රින්ටර් හා UPS සහ වායුසමීකරණ යන්ත්‍ර ෆැක්ස් පණිවිඩ ඔස්සේ මිල ගණන් කැඳවා මිළදීගෙන තිබුණි.

**(ii)** වාහන අලුත්වැඩියා කටයුතු සඳහා සේවා ආයතන තෝරාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.2 මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කළ අවස්ථාවන් නිරීක්ෂණය විය.

(ආ) **අධිකාරී බලය නොමැති ගනුදෙනු**

**-----------------------------------**

2013 ඔක්තෝම්බර් 30 දිනැති MH/HWY/AC/16/02/05/SP අංක දරන අමාත්‍යාංශ තාක්ෂණික පිරිවිතරයන්ට පටහැනිව වසර 05 ක උපාංග විකිණීමේ පලපුරුද්දක් නොතිබුණ පෞද්ගලික ආයතනයකින් රු.282,000 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් මිලදී ගෙන තිබුණි.

**1.8 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 29 | 17 | |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 | |
| (iii) | ද්විතියික මට්ටම | 638 | 412 | 226 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | 70 | 47 | 23 | |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 04 | - | 04 |
| | **එකතුව** | **761** | **497** | **268** | **04** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 268 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**-----------------------------------------------------**

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නිලධාරීන් 61 දෙනෙකු අමාත්‍යාංශයේ විවිධ තනතුරුවල සේවයේ යොදවා තිබුණි.